*සැ. යු.*-2010.10.15 වැනි දින පළ වූ අංක 1,676 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2010 වර්ෂය සඳහා බලපිටිය අධිකරණ කලාපයට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ හා විශේෂ ජූරි සභිකයින්ගේ නාමාවලියක් (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් අයත්) මෙම *ගැසට්* අංකය හා එයට අදාල පළකරන දිනය යටතේ පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,677 - 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2010.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | – | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1847 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1845- B 80163— 8,890 (2010/10)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකියඃ-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය**
**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය**
**(2007 අංක 26 දරන පනතින් ස්ථාපනය කරන ලදී)**

භාෂා පරිවර්තන අධ්‍යනයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

*අභිමානවත් ජීවන වෘත්තියක් ලෙස භාෂා හා භාෂණ පරිවර්තන සේවය තෝරාගැනීම සඳහා මහඟු අවස්ථාවක්.*

රජයේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන භාෂා පරිවර්තකයන්ගේ හිඟයට විසඳුමක් ලබාදීම තුළින් ස්වයං රැකියා අවස්ථා උදාකිරීම පිණිස ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය, භාෂා විෂයයන් කෙරෙහි උනන්දුවක් දක්වන තරුණ තරුණියන් උදෙසා භාෂා පරිවර්තන අධ්‍යනයන් පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සංවිධානය කරනු ලබයි.

වයස අවුරුදු 25ට අඩු සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා විෂයයක් සහිත අ.පො.ස. උසස් පෙළ විෂයන් තුනක් සමත් අ.පො.ස. සා/පෙළ විභාගයේදී සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි විෂයන් සඳහා සම්මාන හෝ සාහිත්‍ය විෂය සඳහා සම්මාන ලබා ඇති තරුණ තරුණියන් ට මේ සඳහා අයදුම් කළ හැකිය.

භාෂා කුසලතා පිළිබඳ අභියෝගතා පරීක්ෂණයකින් අනතුරුව තෝරාගත් අයදුම්කරුවන්ට මාස 04 ක් පූර්ණකාලීනව අගලවත්ත පිහිටි ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පරිවර්තන ක්‍රමවේද හා න්‍යායන් පිළිබඳ පුහුණුවක් ලබාදේ.

මාස 02 ක කාලයක් පුහුණුලාභීන් සඳහා ව්‍යාපෘති පාදක ක්‍රියාකාරකම්ද මාස 06 ක් භාෂා පරිවර්තන කටයුතු පිළිබඳ ප්‍රයෝගික පුහුණුව ද ලබාදීමට අපේක්ෂා කෙරේ. මෙම එක් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කරන පුහුණුලාභීන් සඳහා ඩිප්ලෝමා සහතිකය පරිනමන අතර රජයේ හෝ පෞද්ගලික අංශයේ භාෂා පරිවර්තකයින් ලෙස කටයුතු කිරීමේ හැකියාව උදාවනු ඇත. මීට අමතරව භාෂා පරිවර්තන වෘත්තියේ නියැලීම සඳහා වෘත්තීය බලපත්‍රයක් ද පිරිනැමේ.

පාඨමාලා ගාස්තුව රු. 50,000 ක් වන අතර එක් අයදුම්කරුවකුගෙන් අයකරනු ලබන්නේ 20% ක් පමණි. ඉතිරි මුදල ආයතනය විසින් දරනු ලැබේ.

මාස 04 ක කාලය පූර්ණකාලීන දේශන සඳහා සහභාගිවීමේ දී නේවාසික පහසුකම් ආයතනය විසින් නොමිලේ සපයනු ලබන අතර ආහාරපාන සඳහා යන වියදම් පමණක් අයදුම්කරුවන් විසින් දැරිය යුතුය.

පහත සඳහන් ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් 2010.10.30 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන්, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, පළමු මහල, ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය, 40, බුත්ගමුව පාර, රාජගිරිය, යන ලිපිනයට එවිය යුතුය. (විමසීම් - 0112-883724, 034-3942683).

**ආදර්ශ අයදුම්පත්‍රය**

1. නම :—————.
2. පෞද්ගලික ලිපිනය :—————.
3. උපන් දිනය :—————.
4. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
5. විභාගයට පෙනී සිටීමට කැමති භාෂා මාධ්‍යය :—————.
6. අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. උසස් පෙළ/අපො.ස. සාමාන්‍ය පෙළ :—————.
7. වෙනත් සුදුසුකම් :—————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතු වේ.)

මෙම පාඨමාලාව සඳහා මා තෝරාගනු ලැබුවහොත් එහි කොන්දේසිවලට යටත්ව පුහුණුව ලැබීමට එකගවෙමි.

—————.
අත්සන

දිනය :—————.

10-746

---

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය**
**ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය**
(2007 අංක 26 දරන පනතින් ස්ථාපනය කරන ලදී)

වයඹ පළාතේ තරුණ තරුණියන්ට දේශීය හා විදේශීය භාෂා ඉගෙනීමට කදිම අවස්ථාවක්

දෙස් විදෙස් රැකියා අවස්ථා උදාකරගනු වස් නව ලොව මංපෙත් විවරකිරීම පිණිස භාෂා අධ්‍යාපන පුහුණු පාඨමාලා රැසක් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් සංවිධානය කර ඇත.

මූලික කථන හා ලිඛිත කුසලතා පාදක පහත සඳහන් පාඨමාලා සඳහා වයඹ පලාතේ තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *පාඨමාලාව* | *කාලය* |
|---|---|
| දෙමළ භාෂාව | මාස 04 |
| ඉංග්‍රීසි භාෂාව | මාස 04 |
| කොරියන් භාෂාව | මාස 04 |
| ඉතාලි භාෂාව | මාස 04 |
| ජර්මන් භාෂාව | මාස 04 |
| ප්‍රංශ භාෂාව | මාස 04 |
| ජපන් භාෂාව | මාස 04 |

ඉහත පාඨමාලා හැදෑරීම සඳහා උනන්දුවක් දක්වන තරුණ තරුණියන් තමන් හැදෑරීමට අපේක්ෂා කරන පාඨමාලාවේ නම ලියුම් කවරයේ වම්පස සඳහන් කර පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කර ගත් අයදුම්පත්‍ර, 2010.10.30 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ලිපිනයට එවිය යුතුය. පාඨමාලා සතියේ හා සතිඅන්ත දිනවල කුරුණෑගල නගරයේ දී පැවැත්වේ.

(පාඨමාලා ගාස්තු රු. 8000 සිට රු. 10,000 දක්වා) විමසීම් : 011-2883724, 034-3942683.

**ආදර්ශ අයදුම් පත්‍රය**

හැදෑරීමට අපේක්ෂා කරන පාඨමාලාව ඃ

1. නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. වෙනත් සුදුසුකම් :————.

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ කොන්දේසිවලට යටත්ව පාඨමාලාව හැදෑරීම සඳහා එකඟවෙමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

10-745

---

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2010

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට (මෙහි මින් ඉදිරියට 'සේවය' යනුවෙන් සඳහන් වන) සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගයක් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ඇත.

02. විභාග පරිපාටිය සහ දිනය - මේ විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ.

**I වැනි කොටස - ලිඛිත විභාගය**

ලිඛිත විභාගයන් වන I වැනි කොටස මතු සඳහන් විෂයන් පිළිබඳ ප්‍රශ්නපත්‍රවලින් සමන්විත කොට, 2011 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.

1. පොදු ප්‍රශ්න පත්‍රය;
2. ලෝක තතු I (දේශපාලන);
3. ලෝක තතු II (ආර්ථික);
4. රචනය;
5. සාරාංශය ලිවීම;
6. බහුවරණ ප්‍රශ්න පත්‍රය.

**II වන කොටස - සම්මුඛ පරීක්ෂණය**

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්නපත්‍රයකට අවම වශයෙන් 40%ක් බැගින් සහ මුළු ලකුණු 330කට අඩු නොවන පරිදි විදේශ කටයුතු ලේකම් විසින් නිගමනය කෙරෙන සීමාව ඉක්මවා හෝ ඊට ඉහළින් මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණි. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි වනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100ක් හිමි වේ. කිසිම හේතුවක් නිසාවත් අවම මුළු ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

03. *සේවා කොන්දේසි* :

(අ) මේ විභාගයේ ප්‍රතිඵල මත තෝරාගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත වසර 2001 ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක් කර ඇත්තාවූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වෙතොත් ඒවා ද සමග එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

04. *වැටුප් ක්‍රමය (මාසික)* :

මෙම සේවයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි එස්එල්-1-2006 වැටුප් බණ්ඩය අදාළ වේ. එම වැටුප් බණ්ඩයට අදාළ වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 22,935-10 x 645-8 x 790-17 x 1050 = රු. 53,555

(i) ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරීන් පහත සඳහන් මාසික වැටුප් තලයන්ට ළගාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාග තුනකින් සමත් විය යුතුය.

| | |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | රු. 24,870 ට පෙර |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | රු. 27,450 ට පෙර |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | රු. 31,965 ට පෙර |

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2001 අනුව පළමුවන කාර්යක්ෂමතා කඩඉම වසර තුනක් (3) ඇතුළත ද දෙවන කාර්යක්ෂමතා කඩඉම වසර හයක් (6) ඇතුළත ද සමත් විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 අනුව රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතුය.

05. *සෞඛ්‍ය සහ චරිතය.*—අයදුම්කරු මනා ශරීර සෞඛ්‍යයෙන් හා ඉතා යහපත් චරිතයකින් යුතු වන බවට විදේශ කටයුතු ලේකම්වරයා සෑහීමකට පත්විය යුතු අතර, ඔහු/ඇය සෞඛ්‍ය තත්ත්වයෙන්, මෙරට හෝ ලෝකයේ ඕනෑම පෙදෙසක සේවය සඳහා සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් ද යුක්ත විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කෙරෙනු ඇත.

06. යෝග්‍යතාව.—අයදුම්කරු/අයදුම්කාරිය;

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතුය.

*නැතහොත්*

(ii) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ උපාධියක් ලබා සිටිය යුතුය. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට එළඹ සිටිය යුතු අතර අවුරුදු 30ට නොඑළඹ සිටිය යුතුය. රාජ්‍ය සේවයේ නිරත අයැදුම්කරුවකු වේ. නම්, ඔහු/ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40ට නොඑළඹ සිටිය යුතු අතර, සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතුය.

**සටහන** (i) - ඉහත 6 (ඇ) ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයැදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ 1 වැනි පරිච්ඡේදයේ නිර්වචනය කොට ඇති පරිදි) අයැදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

**සටහන** (ii) - අයැදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළ දී හෝ සේවයේ යෙදී සිටි කාලසීමාව ඊට අඩු නම් එම මුළු කාලසීමාවේ දී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියකු මේ විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

**සටහන** (iii) - රාජ්‍ය සේවයේ නිලධාරියකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු/ඇය අයැදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාලසීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාලසීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

**සටහන** (iv) - රාජ්‍ය සේවයේ නියුක්ත අයැදුම්කරුවන් තම අයැදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගිනි.

07. *විභාග ගාස්තුව.*—විභාගය සඳහා වු ගාස්තුව රු. 1,000 කි. අයැදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනයට පෙර, මේ ගාස්තුව ආදායම් ශීර්ෂ 2003.02.13ට බැර වනු පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුවේ. ගෙවීම සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය අයැදුම්පතට ඇමිණිය යුතුය. අදාළ කුවිතාන්සියේ ඡායා පිටපතක් අයැදුම්කරු විසින් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.

*සැලකිය යුතුයි.*—කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත්වන හෝ, නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයකුට විභාග ගාස්තුව මුළුමණින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත.

08. *අයැදුම් කරන පිළිවෙල :*

(අ) මේ දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව අඟල් 8.5 x 11.6 (ඒ4) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයැදුම්පත් සකස් කරගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ අංක 01 සිට 07තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 2 වන හා 3 වන පිටුවලට ද වන ලෙස සකස් කළයුතුය. අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිළිව පිරවිය යුතුවේ.

ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ආ) අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයැදුම්පත පිළියෙල විය යුතුය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයැදුම්පත බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (සංවිධාන හා විදේශ විභාග ශාඛාව) විභාග කොමසාරිස් ජනරාල් වෙත 2010 නොවැම්බර් මස 22 වන දා හෝ ඊට පෙර හෝ, ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුයි. අයැදුම්පත් බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2010" යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුයි. ලියුම් කවරයේ වමත්පස ඉහළ කෙළවරේ (සෙ. මී. 2 x සෙ. මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ ඉංග්‍රීසි ''S''අක්ෂරය සඳහන් කළ යුතුය. එකී දිනට පසුව ලැබෙන කිසිදු අයැදුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයැදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේදී යම් අයැදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) අයැදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ විගස ඒ බව දැක්වෙන දැන්වීමක් පුවත්පත්වල පල කරන හෙයින් අයැදුම්කරුවන් ඒ ගැන සෝදිසියෙන් සිටීම යෙහෙකි.

(ඊ) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

09. *විභාගයට ප්‍රවේශය :*

(අ) අයැදුම්පත් එවූ සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාට විභාග කොමසාරිස් ජනාරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයැදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ආ) අයැදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේ දී ය. සෑම අපේක්ෂකයකු/

අපේක්ෂිකාවක්ම විභාගයට පෙනී සිටින පළමු වන දිනයේදී ම විභාගයට පෙනී සිටීමට පෙර එම විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාර දිය යුතුයි. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට් පත්‍රයේ* පළවේ.

සටහන - අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ පමණින් ඔහුට/ඇයට ගැසට් නිවේදනයෙන් අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති බවක් නොහැඟේ.

10. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.*—අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනලද ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. අසත්‍ය තොරතුරු සැපයීම ගැන දණ්ඩන.—යම් අපේක්ෂකයකු/අපේක්ෂිකාවක නුසුදුසු බව දක්නට ලැබුනොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරේ දී හෝ විභාගය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම විටකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි වේ. යම් අයදුම්කරුවකු සැපයු තොරතුරු ඔහු/ඇය දන්නා පරිදි අසත්‍ය බව හෝ, ඔහු/ඇය සිතා මතා යම් වැදගත් තොරතුරක් වසන් කළ බව හෝ දක්නට ලැබුනහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබීමට ඉඩ තිබේ.

12. විභාග භාෂා මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පැවැත්වේ.

(ආ) අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභාගයට පෙනී සිටිය හැකිය.

එසේ ද වුවත් ඔහු/ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

13. *පරීක්ෂණ ක්‍රමය* :

I වැනි කොටස : ලිඛිත විභාගය - මෙය පහත සඳහන් විෂයයන් හයකින් (06) සමන්විත වනු ඇත.

| *විෂය අංකය* | *විෂය* | *නියමිත කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| 01 | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 යි | 100 යි |
| 02 | ලෝක තතු I | පැය 03 යි | 100 යි |
| 03 | ලෝක තතු II | පැය 03 යි | 100 යි |
| 04 | රචනය | පැය 03යි | 100 යි |
| 05 | සාරාංශ ලිවීම | පැය 01 යි | 100 යි |
| 06 | බහුවරණ ප්‍රශ්න පත්‍රය | පැය 01යි විනාඩි 40 යි | 100 යි |

**ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය** :

(i) පොදු ප්‍රශ්නපත්‍රය.—ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳවත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන වත්මන් කරුණු පිළිබඳවත් සහ තාක්ෂණික හා විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳවත් අයදුම්කරු ලබා ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(ii) *ලෝක තතු i* - සමස්ත ලෝකයේ සාමය, ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා සහ ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා ලෝකයේ දේශපාලන සිදුවීම්, එක්සත් ජාතීන්ගේ සංවිධාන හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා ගැටුම් තත්ත්වයන් හා නොයෙකුත් ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරවල දියුණුව අලලා වූ ප්‍රශ්නවලින් මේ ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

(iii) *ලෝක තතු ii* - ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය, කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම, පරිසරය හා ධරණීය සංවර්ධනය වැනි ප්‍රශ්න ද ඇතුළත්ව වෙළඳාම හා ආර්ථික සංවර්ධනය පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා හා ඒවා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු වේ.

(iv) *රචනය* - නියමිත විෂයයක් හෝ කිහිපයක් හෝ යටතේ රචනය ලිවිය යුතුය. මෙම මාතෘකා අධ්‍යයන ක්ෂේත්‍රයේ කිසිම විෂයකට සම්බන්ධ නොවන අතර, එය සකස් කරනු ලබන්නේ අපේක්ෂකයා/අපේක්ෂිකාව ගේ සාමාන්‍ය දැනීම සහ බුද්ධියත්, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවන් පරීක්ෂා කිරීම පිණිසය. මාතෘකාව යටතේ කරුණු දැක්වීමෙහිලා අයදුම්කරුගේ කල්පනා ශක්තිය හා ප්‍රතිභාව මෙන්ම භාෂා ශෛලිය හා ඉදිරිපත් කිරීමේ හැකියාව නිශ්චය කිරීම සඳහා රචනය උපයෝගි කරගනු ලැබේ. එය කියවිය හැකි පරිදි පැහැදිලි අකුරෙන් ලිවිය යුතුය.

සටහන - කරුණට අදාළවන පරිදි පැහැදිලිව ලිවීමේ වැදගත්කම කෙරෙහි අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විෂයය මනා පරීක්ෂණයට භාජනය කිරීම, විමසා බැලීමේ ශක්තිය, ලිවීමේ තත්ත්වය, තම අදහස් කෙටියෙන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තිය සඳහා ලකුණු හිමිවේ.

(v) *සාරාංශ ලිවීම.*—දී ඇති ඡේදයක/ඡේදයන්හි අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇදගන්නා ආකාරයෙන් පැහැදිලිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(vi) *බහුවරණ ප්‍රශ්න පත්‍රය.*—කොටස් දෙකකින් යුක්ත මෙම ප්‍රශ්න පත්‍රය වාස්තවික ආකාරයේ ප්‍රශ්නවලින් සමන්විත වන අතර, මතු සඳහන් කාණ්ඩ වලින් යුක්ත වේ. එහි එක් කොටසකට ලකුණු පනහ (50) බැගින් ලැබේ.

(අ) *බුද්ධි පරීක්ෂණය* : අයදුම්කරුගේ තර්කානුකූල හේතු දැක්වීමේ හා විස්තර විභාග කිරීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා.

(ආ) *සාමාන්‍ය දැනීම හා වත්මන් තතු* : දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍රවල වත්මන් සිදුවීම් පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා.

14. *සම්මුඛ පරීක්ෂණය.*—අපේක්ෂක අපේක්ෂිකාවන් සාමාන්‍යයෙන් වැදගත් වන කරුණු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/අපේක්ෂිකාව බඳවා ගනු ලබන සේවයට ඔහුගේ/ඇයගේ යෝග්‍යතාව මැන බැලීම සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. මණ්ඩලය තම නිගමනයට එළඹීමේ දී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ බුද්ධිය සහ මානසික උත්සුකතාව කෙරෙහිත්, පෞරුෂත්වය කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අනිකුත්

භාෂා ප්‍රවීණතාව, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පරිගණක හැකියාව මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ඇගයීමට ලක්කරනු ඇත.

15. *පත්වීම සඳහා තෝරා ගන්නා පිළිවෙල.*—පත්වීම සඳහා තෝරා ගනු ලබන්නේ ලිඛිත විභාගයත්, සම්මුඛ පරීක්ෂණයත් යන දෙකෙන්ම ලබා ඇති මුළු ලකුණු ගණන මත විදේශ ලේකම් විසිනි.

16. මෙම ගැසට් නිවේදනයේ, සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය විදේශ ලේකම්ගේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය විදේශ ලේකම් සතු ය.

සී. ආර්. ජයසිංහ,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 07 වැනි දින,
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2010

Open Competitive Examination for Recruitment to Grade III of The Sri Lanka Foreign Service - 2010

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

01. (i) (අ) මුල්'කුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි) කැපිටල් අකුරෙන් : උදා : SUMANASIRI, B. A. :————.

(ආ) මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමග නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

(ii) (අ) මුල්'කුරුවලින් කියැවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ආ) මුල්'කුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :————.

(i) පදිංචි ස්ථානයේ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(විභාග ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මෙම ලිපිනයටය)

(ii) කාර්යාලයීය :————.

(iii) දුරකථන අංකය : කාර්යාලයීය :————.
(පෞද්ගලික) :————.

03. ස්ත්‍රී/පුරුෂභාවය :

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
පුරුෂ - 0

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. (i) උපන් දිනය :

අවුරුද්ද මාසය දිනය

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

06. ජනවර්ගය :
(අදාළ අංකය කොටුව තුළ යොදන්න.)
සිංහල - 1
දෙමළ - 2
ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4
වෙනත් - 5

07. විවාහක/අවිවාහක බව :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)
අවිවාහක - 1
විවාහක - 2

08. ශ්‍රී ලංකා විදේශ සේවයට පත්වීම සඳහා මීට පෙර යම් විභාගයකට පෙනී සිට ඇත්නම් අවුරුද්ද/අවුරුදු සඳහන් කරන්න.
(අ) ————.
(ආ) ————.
(ඇ) ————.

09. ඔබ රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන උපාධිධාරියෙක් නම් එම තනතුරේ නම සඳහන් කරන්න. :————.

10. උපාධිය පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය (මෙහිලා සුදුසුකම් තිබේදැයි දැනගනු පිණිස මේ දැන්වීමේ 6 (ආ) ඡේදය කියවා බලන්න.)

(i) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධියේ නම :————.
(iii) උපාධිය පිරිනැමූ දිනය:————.
(iv) සාමාන්‍ය/විශේෂ :————.
(v) විෂයය :————.
(vi) පන්තිය :————.

11. අදාළ වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/විදේශ භාෂා ප්‍රවීණතාව ආදිය) සඳහන් කරන්න. :————.

12. මගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව මෙහි සඳහන් තොරතුරු සැබෑ බවත් විභාග ගාස්තු ගෙවා ලබාගත් ............... දින හා අංක ............... දරන කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් මෙයින් ප්‍රකාශ කරමි. විභාගයට බලපවත්නා නියමයන්ටත් විභාගයේ නීතිරීති අනුව මා නුසුදුසු බව දක්නට ලැබුනහොත් විභාගයට පෙර හෝ

විභාගය පවත්වන අතරතුරේදී හෝ විභාගයෙන් පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයන් වෙතොත් ඊටත් අවනත වීමටද මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

| විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |
|---|

———————.
අයැදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/පළාත් පාලන සේවයේ නියුතු අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් නම් පමණි.)

…………… මහතා/මෙනෙවිය/මිය …………… දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ (අ) තමාට හිමි සියලු වැටුප් වර්ධක උපයා ඇති බවත්, (ආ) අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත් සොයා බලා සැකහැර දැනගතිමි.

මේ අයැදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

මේ නිලධාරියා/නිලධාරිණිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි වේ.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ පදවිය.

දිනය :—————.

10-844

---

## යෞවන කටයුතු අමාත්‍යාංශය

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III පන්තියේ කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2011

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන පහත සඳහන් තාක්ෂණ විද්‍යාලයන් සඳහා ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III වැනි පන්තියේ පහත සඳහන් කථිකාචාර්ය තනතුරු සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

තාක්ෂණ විද්‍යාල :

1. මරදාන තාක්ෂණ විද්‍යාලය
2. ගාල්ල කාර්මික විද්‍යාලය
3. කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය
4. මහනුවර තාක්ෂණ විද්‍යාලය
5. බදුල්ල තාක්ෂණ විද්‍යාලය
6. අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය
7. අම්පාර තාක්ෂණ විද්‍යාලය
8. යාපනය තාක්ෂණ විද්‍යාලය
9. රත්නපුර තාක්ෂණ විද්‍යාලය

බඳවා ගනු ලබන තනතුරු පිළිබඳ විස්තරය :

| *තනතුරු අංකය* | *තනතුර* | *ඉගැන්වීමේ මාධ්‍යය* |
|---|---|---|
| 1. | කථිකාචාර්ය (සිවිල් ඉංජිනේරු) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 2. | කථිකාචාර්ය (විදුලි ඉංජිනේරු) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 3. | කථිකාචාර්ය (පෑස්සුම් තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 4. | කථිකාචාර්ය (මෝටර් රථ තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 5. | කථිකාචාර්ය (ස්වර්ණාභරණ නිර්මාණ තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 6. | කථිකාචාර්ය (ජීව වෛද්‍ය උපකරණ තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 7. | කථිකාචාර්ය (ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 8. | කථිකාචාර්ය (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |
| 9. | කථිකාචාර්ය (තොරතුරු හා විදුලි සංදේශ තාක්ෂණය) | ඉංග්‍රීසි මාධ්‍යය |

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවැනි පිටුවට ද, 07 සිට 12 තෙක් 02 වැනි පිටුවට ද ඉතිරිය 03 වැනි පිටුවට ද ගෙන, සකස්කර ඊට අදාල තොරතුරු තම අත් අකුරෙන් ම විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යයෙන් පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපත් ලඟ තබා ගැනීම ප්‍රයොජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව ද ඉල්ලුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයැදුම්පත් 2010.11.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, කොළඹ 10" යන ලිපිනයට එවිය යුතු ය. අයැදුම්පත් බහා එවන කවරයේ වමත්පස උඩ කෙළවරෙහි "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වන පන්තියේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) කථිකාචාර්ය තනතුරු" යනුවෙන් සඳහන් කළ යුතු ය. එක් තනතුර කට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම්, අයදුම්පතේ තමන් තනතුරු තෝරාගන්නා අනුපිළිවෙල අනුව තනතුරු අංක හා තනතුරු නාමයන් සඳහන් කර එක් ඉල්ලුම් පත්‍රයක් පමණක් එවිය යුතු ය. *ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් ලැබූ අය පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලැබේ.*

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වන අතර තෝරාගන්නා අපේක්ෂකයින් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර තුන් අවුරුදු පරිවාස කාලයකට යටතේ වේ.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

කාර්යක්ෂමතා කඩඉම :

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2001 ට අනුව 04 වැනි වැටුප් පියවරට එළැඹීමට පෙර පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම ද 07 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර දෙවැනි කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය. නියමිත කාලය ඇතුළත දී කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වීම වැටුප් වර්ධක විලම්භනය කිරීමට හේතුවන අතර, දී ඇති කාලසීමාව ඉක්මවා ගන්නා කාලය වැටුප් වර්ධක විලම්භනය කෙරෙන කාලසීමාව වශයෙන් සැලකෙනු ඇත. තවද, මෙම නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන තෙක් ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ කිසිම උසස් තනතුරක් සඳහා අයදුම් කිරීමට ද සුදුසුකම් නොලබනු ඇත.

(ඈ) මෙම තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය. එසේ එම කාලය තුළ නියමිත භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. මෙම නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීණතාවන් ලෙස අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයයන් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත් වීම අවශ්‍ය වේ.

03. *වැටුප් හා දීමනා* :

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 22,935 - 645 x 10 - 790 x 8 - 1050 x 17 - රු. 53,555 වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ. වැටුප් වර්ධක ගෙවීම ඉහත 02 ඡේදයේ "ආ" හි සඳහන් කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට යටත් වනු ඇත.

04. සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකු ම පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

(අ) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(ආ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ඇති අදාල විෂය ක්ෂේත්‍රය ඇතුළත් උපාධියක් ලබා ගැනීමෙන් පසුව පිළිගත හැකි ආයතනයක අවුරුදු 03 ක ඉගැන්වීමේ/ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබීම.

(ඉ) කථිකාචාර්ය (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) සඳහා අදාළ විෂයය ක්ෂේත්‍රය නිර්ණය කිරීමේ දී උපාධියේ විෂයයක් ලෙස එම විෂයය හදාරා තිබීම ප්‍රමාණවත් නොවනු ඇත. ඉගැන්වීමේ හෝ ක්ෂේත්‍ර පළපුරුද්දට පහත සඳහන් අනු ක්ෂේත්‍රවලින් එකක් හෝ කිහිපයක් හෝ ඇතුළත් විය යුතු ය.

| අනු. අංකය | තනතුර | අනු ක්ෂේත්‍ර |
|---|---|---|
| 01 | කථිකාචාර්ය (සිවිල් ඉංජිනේරු) | - ගොඩනැගිලි තාක්‍ෂණය<br>- මහාමාර්ග තාක්‍ෂණය<br>- ජල සැපයුම් හා ජලාපවහන තාක්‍ෂණය<br>- වාරි තාක්‍ෂණය |
| 02 | කථිකාචාර්ය (විදුලි ඉංජිනේරු) | - Power generation,<br>- Transmission and distribution |
| 03 | කථිකාචාර්ය (පෑස්සුම් තාක්‍ෂණය) | - Welding Processes<br>- Prevent Weld Defects<br>- Identify Material used in Welding & Select Welding Process<br>- Monitor Maintenance Shedule of Welding Equipment and Accessories<br>- Heat Treatment |
| 04 | කථිකාචාර්ය (මෝටර් රථ තාක්‍ෂණය) | - ඩීසල් හා පෙට්‍රල් එන්ජින්<br>- මෝටර් රථ විදුලි<br>- මෝටර් රථ වායු සමීකරණ |
| 05 | කථිකාචාර්ය (ස්වර්ණාභරණ නිර්මාණ තාක්‍ෂණය) | - ස්වර්ණාභරණ යන්ත්‍රෝපකරණ නඩත්තු<br>- ස්වර්ණාභරණ නිර්මාණ<br>- ස්වර්ණාභරණ නිෂ්පාදන |
| 06 | කථිකාචාර්ය (ජීව වෛද්‍ය උපකරණ තාක්‍ෂණය) | - Micro computer hardware, Operations and troubleshotting<br>- Semi conductor devices and analog circuits<br>- Digital electronic and applications<br>- ජීව වෛද්‍ය උපකරණ නඩත්තු හා ක්‍රියාකරවීම |
| 07 | කථිකාචාර්ය (ගොවිපොල යන්ත්‍රෝපකරණ තාක්‍ෂණය) | - ගොවිපොල යන්ත්‍රෝපකරණ උපාංග පරීක්‍ෂාව<br>- ගොවිපොල යන්ත්‍රෝපකරණ උපාංග නිර්මාණ<br>- ගොවිපල යන්ත්‍රෝපකරණ උපාංග නිෂ්පාදනය<br>- ගොවිපොල යන්ත්‍රෝපකරණ ඇගයීම හා තෝරාගැනීම |
| 08 | කථිකාචාර්ය (තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය) | - බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය<br>- ජාලකරණය<br>- දෘඪාංග හා මෘදුකාංග |
| 09 | කථිකාචාර්ය (තොරතුරු හා විදුලි සංදේශ තාක්‍ෂණය) | - Switching, networking, transmission and Maintenance of equipment |

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන තාක්ෂණ විද්‍යාල සඳහා ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ III වැනි පන්තියේ කථිකාචාර්ය පුරප්පාඩු සඳහා විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව පත්වීම් බලධරයා වෙනුවෙන් මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

06. පහත සඳහන් ලියකියවිලි සියල්ලේ ම තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපතක් අයැදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ භෞතීස්ම සහතික භාරගනු නොලැබේ),

(ii) හැදෑරූ විෂයන් වල විස්තර සහිතව උපාධි සහතික හෝ අනෙකුත් අධ්‍යාපන සහතික,
(iii) පළපුරුද්ද සනාථ කෙරෙන වෘත්තීය සහ/හෝ තාක්ෂණික සුදුසුකම් දැක්වෙන සහතික,
(iv) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

07. රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයින්ගේ අයැදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

08. මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටසේ (II 'අ') වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සහ 1986.08.15 දිනැති අංක 415 දරන *රජයේ ගැසට් පත්‍රයේ* සාමාන්‍ය 1 වන කොටස යටතේ ප්‍රකාශයට පත් කරන ලද "ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවා ව්‍යවස්ථා සංග්‍රහය" කෙරෙහි ද අපේක්ෂකයින් ගේ අවධානය යොමු කරවනු ලැබේ.

09. සියලුම අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන පහත සඳහන් විෂයයන් ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. විභාගය පැවත්වෙන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් බව සලකන්න. ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) සාමාන්‍ය දැනීම ලකුණු 100 යි, පැය එකක ප්‍රශ්න පත්‍රයකි.
(ii) බුද්ධි පරීක්ෂණය ලකුණු 100 යි, පැය එකක ප්‍රශ්න පත්‍රයකි.

තරග විභාගයේ කුසලතාවය අනුපිළිවෙල අනුව සුදුසුකම් ලබන අයැදුම්කරුවන් බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.)

එක් එක් විෂයයේ ලකුණු 40% හෝ ඊට වැඩිය ලබාගත් අයැදුම්කරුවන් ඔවුන්ගේ එම ලකුණුවල එකතුව අනුව ප්‍රමුඛතා ලේඛනය සකස් කරනු ලබන අතර, එක් එක් විෂයය ක්ෂේත්‍රයන්හි පුරප්පාඩු අනුව බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ඇත.

10. *විෂය නිර්දේශය* :

10.1 සාමාන්‍ය දැනීම පැය 1 යි
ආර්ථික, සමාජයීය, දේශපාලනික, භූගෝලීය කරුණු පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමෙන් අපේක්ෂකයා තුළ ඇති දැනුම පිරික්සීම සඳහා මෙම ප්‍රශ්ණ පත්‍රය සකස්කර වන අතර, බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.

10.2 බුද්ධි පරීක්ෂණය - පැය 1 යි

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය තීරණ ගැනීමේ ශක්තිය හා බුද්ධිමට්ටම විනිශ්චය කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.

11. *විභාග දිනය* : මෙම විභාගය 2011 ජනවාරි මස දී කොළඹ නගරයේ දී පැවැත්වෙනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට යෝවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට බලය ඇත.

* අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබා ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

12. *විභාග ගාස්තු* : විභාගය සඳහා වූ ගාස්තුව රු. 400 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ මහජන බැංකුව නගර මධ්‍ය ශාඛාවේ අංක 176-1001-39026228 ගිණුමට මුදල් බැර කර ලබා ගත් ලදු පත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

13. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ නොපිරවීමේ අයිතිය යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

14. ආයතන සංග්‍රහයෙහි 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 තෙක් ඡේදයන්හි වගන්ති තනතුරට ගැලපෙන පරිදි අදාල වේ.

15. විභාග ආරම්භ වන දිනයේ තම අත්සන සහතික කරවාගත් සහතික පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

16. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණි.

17. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවනු ඇත.

18. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

සු. සෝ. හේවාපතිරණ,
ලේකම්,
යෞවන කටයුතු අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 05 වැනි දින,
නිපුණතා පියස,
354/2,
ඇල්විටිගල මාවත,
කොළඹ 05,
යෞවන කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

යෞවන කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ (විශේෂ සේවක සංඛ්‍යාවේ) III පන්තියේ කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය - 2011

| | *තනතුරු* | *තනතුරු අංකය* |
|---|---|---|
| 1 වැනි කැමැත්ත | | |
| 2 වැනි කැමැත්ත | | |
| 3 වැනි කැමැත්ත | | |

* *ගැසට් නිවේදනයේ* 01 වන ඡේදය බලන්න. අනුපිළිවෙල පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | |
|---|---|
| 1.0 භාෂා මාධ්‍ය : විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය<br>සිංහල - 2 ☐<br>දෙමළ - 3 ☐<br>ඉංග්‍රීසි - 4 ☐<br>(අදාල අංකය කොටුව තුළ ලියන්න.) | |

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ඉංග්‍රීසි කැපිටල් අකුරින්
*උදාහරණ* : SILVA, A. B.

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

02. සම්පූර්ණ නම :—————.

03. (*අ*) රාජකාරි ලිපිනය :—————.
(*ආ*) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(මෙම ලිපිනයට ප්‍රවේශපත් තැපැල් කරනු ලැබේ.)
(*ඇ*) පෞද්ගලික දුරකථන අංකය :—————.

04. (අ) ඔබ ශ්‍රී ලාංකිකයකු ද යන වග : ඔව් ☐ නැත ☐

05. (අ) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :

(අ) තනතුර හා පත්වීමේ දිනය :——————.

(ආ) තනතුර ස්ථිර ද, තාවකාලික ද යන වග :——————.

(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :——————.

(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත් ද යන වග :——————.

(ඉ) දෙපාර්තමේන්තුව :——————.

(ඊ) ආයතනය/සේවා ස්ථානය :——————.

08. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ භාෂාවෙහි ප්‍රවීනතාවය පිළිබඳ සහතිකද ඇතුළුව)

| *සමත් වූ විභාගය* | *විශ්ව විද්‍යාලය/ ආයතනය* | *සමත් වර්ෂය* | *විෂයය ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

09. ඉගැන්වීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *ඉගැන්වීම/ සේවය කළ ආයතනයේ නම* | *තනතුර* | *ලබාගත් සහතිකය* | *කාලසීමාව* | *විෂයය ක්ෂේත්‍රය/ වෘත්තීය ක්ෂේත්‍රය* |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |

(අදාළ සහතිකවල සහතික පිටපත් ඇමිණිය යුතුය)

10. කලින් දරන තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න)

| දෙපාර්තමේන්තුව/ ආයතනය | සේවා ස්ථානය | තනතුර | ස්ථිරද තාවකාලික ද යන වග | සිට | තෙක් | සේවා කාලය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

11. ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර දක්වන්න. :—————.

12. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න. :—————.

13. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්‍ෂණයක් පැවැත්වෙමින් තිබේ ද? එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

ම'විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරැදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොලබා මා තනතුරින් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනට රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත අයදුම්කරුගේ අනු අංක 10 සිට 13 තෙක් සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

10-882

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.